# ගම්පහ අධ්‍යාපන කලාපය

## අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2020

## සිංහල භාෂාව හා සාහිත්‍යය

**කාලය පැය 01 යි.** **11 ශ්‍රේණිය**

**සැලකිය යුතුය.**

i. සියලුම ප්‍රශ්න වලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල , දී ඇති (1) , (2) , (3), (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්න වල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න .

1. සැකයෙන් අත්අඩංගුවට ගන්නා කෙනෙකු වැරදිකරුවෙකු ලෙස **හංවඩු ගැසීම** අනුමත කළ නොහැක.
(1) හිත සැනසීම (2) දඬුවම් ලබාදීම
(3) සතුටින් පිළිගැනීම (4) හෙළා දැකීම
2. ඡන්දය පැවැත්වෙන අවධියේ ඡන්ද අපේක්ෂකයන් කරන ප්‍රකාශයන් **හමස් පෙට්ටියට** යාම ඔවුන්ගේ පරාජයට හේතුව වේ.
(1) ක්‍රියාත්මක කිරීමට උනන්දු නොවීම (2) ප්‍රකාශයට පමණක් සීමා වීම
(3) ක්‍රියාත්මක නොවී තිබීම (4) හෙළා දැකීම
3. ඔවුන්ට තව දුරටත් උපදෙස් දීම **අඟින් කිරි දෙවීමක්** බව අපි කාගේත් අදහස වීමු.
(1) අන්තිමට කළ යුත්තක් බව (2) නිරතුරුව කළ යුත්තක් බව
(3) අනිත් අය ලවා කළ යුත්තක් බව (4) නිශ්ඵල කාර්යයක් බව

- අංක 04 සිට 6 තෙක් ඇති ප්‍රශ්න වල හිස්තැන් වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. සඳ රැසින් ............... කුමුදු විලක් මෙන් ළමයි ඉතා සතුටට පත් වූහ.
(1) මුකුලිත (2) සුලලිත
(3) විකසිත (4) විස්මිත

5. භාණ්ඩ හුවමාරු ක්‍රමය මුදලේ ........... ක්‍රියාවලියේ ආරම්භයයි.
(1) ආක්‍රමණ (2) සංක්‍රමණ
(3) සංසරණ (4) සංකීර්ණ

6. විශේෂාංග ලිපියක් , ප්‍රවෘත්තියක් හෝ වාර්තාවක් මෙන් ම සමාජ වැදගත්කමකින් යුක්ත වෙනත් ............ ද පදනම් කොට ගනිමින් සම්පාදනය කළ හැකි ය .
(1) සංවාදයක් (2) ප්‍රකාශයක්
(3) නිර්මාණයක් (4) මූලාශ්‍රයක්
7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) ඡත්තපාණි , ඡත්‍රාවලිය, ඡවි වර්ණය, ඡායා මාත්‍රය
(2) ජනනය, ජනනායක, ජනාපවාදය, ජනාධිපති
(3) කළමනාකරණය, කළු ඉංගිරියාව, කළුකඩකාරයා, කළුපහණ
(4) කළු ඉංගිරියාව, කළුකඩකාරයා, කළු පහණ, කළමනාකරණය

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) අත්‍යවශ්‍ය , නීත්‍යානුකූල, ප්‍රාසංගික , සාමාර්ථ්‍යය
(2) විද්‍යමාන, ස්තුති, ව්‍යුහය, ව්‍යංග්‍යාර්ථ
(3) අවස්ථාවෝචිත,ඓක්‍යය, ගෘහස්ත, මාතෘකා
(4) සූර්යයා, කල්‍යාණ, වාක්‍ය, ප්‍රකෘති

9. එක් එක් වචනවල මුලකුරෙහි ඇදය,ඇලපිල්ල,රකාරංශය, පාපිල්ල පිළිවෙලින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
(1) රුවල, ආකාසය, ප්‍රමාණය, කුල්ල (2) වැලිබත්. ආදරය, ධ්වනිය, කුල්ල
(3)රුවල, ඇකය, ප්‍රමාණය, කුල්ල (4) වැලිත්, ආදරය, ප්‍රමාණය, කුල්ල

10. සමානාර්ථය,අවධාරණාර්ථය,වාක්‍යාවසානය හා විකල්පාර්ථයේ නිපාත පද පිළිවෙලින් යෙදී ඇති වරණය වන්නේ,
(1) එවි,විනා, යි, එහෙත් (2) සේ, වූ කලි, ය, එහෙත්
(3) එවි, විනා, ය, හෙවත් (4) සේ, වූ කලි, යි, හෙවත්

11. භූතාර්ථය, නියුක්තාර්ථය,ජනනාර්ථය හා ස්වාර්ථය හැඟවීම සඳහා නිරවද්‍ය නිදසුන් දක්වා ඇති තද්ධිත පද ඇතුළත් වරණය වන්නේ,
(1) ගැමියා, තොටියා, ශිල්පියා, කැබලි (2) තොටියා, ගැමියා, කැබලි, ශිල්පියා
(3) මැදිරි, රැටියා, දැහැමි, ශිල්පියා (4) ගැමියා, ශිල්පියා, තොටියා, කැබලි

12. A ගමන - ජී.බී.සේනානායක
B වහල්ලු - මහගම සේකර
C බෝඩිම - මාර්ටින් වික්‍රමසිංහ
D සුදු කොඩි - ඇරැව්වල නන්දිමිත්‍ර
ඉහත කෙටිකතාවල කතුවරුන් නිවැරදිව දක්වා ඇති වර්ණය වන්නේ,
1. B හා A 2. B හා C 3. C හා D 4.A හා D

13. A කලු ගෑනි තරඟයට ඉහළ ගිය
සිමෙන්ති බිත්ති මිසක } හඳ සහ නිව්යෝක් නුවර
B පුර යෝගත් වුවත්
නුවන් පිළිබිඹු දිස්නා } මුවදෙව්දාවත
C කතා බහෙන් සිනාසෙමින්
ජීවිතයේ ගිරිදුර්ගය නගින
සොදුරු ගැහැණිය ඔබ } අසන් පත්තිනි දේවතාවි
D මල්ලිට නාං කොහොමත් බෑ වැඩිවෙලා හැංගෙන්නට
අහු වෙනවා එක පාරට ඒ අත මේ අත යනකොට } වක්කඩ බඳිමු

ඉහත පද්‍ය නිර්මාණ දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
1. ABC 2. BCD 3. ACD 4. ABD

14. වක්කඩ බඳිමු, උදය, සඳගිර, අලුත ගෙනා මනමාලිය යන පද්‍ය නිර්මාණකරුවන් අනුපිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ,
A. - ජී.බී.සේනානායක
B. - සිරි ගුණසිංහ
C. - ගුණදාස අමරසේකර
D. - ජයලත් මනෝරත්න
1. CBD හා A 2. ABC හා D 3. CAD හා B 4. DCB හා A

- අංක 15 සිට 17 තෙක් තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

15. සාහිත්‍යකරුවා භාෂාව භාවිතා කරනුයේ **භාවික ගුණයෙන්** යුතුම ය.
(1) විවිධ ප්‍රකාශන විලාස යොදා ගැනිමෙන් (2) තමන්ට ආවේණික ලක්ෂණ වලින්
(3) හැඟීම් ප්‍රබෝධවන ආකාරයෙන් (4) අනුප්‍රාසය මතුවන අයුරින්
16. ස්වාධීන ලංකා විශ්ව විද්‍යාලය ඒකීය වූ ද , නේවාසික වූද ආයතනයක් විය යුතු බවට එකඟතාවයක්, යටත් විජිත පාලනයක් විශ්ව විද්‍යාල ව්‍යාපාරයේ අයත් අතර **ස්ථාපනය** විය.
(1) මතයක් වීම (2) ස්ථිර ලෙස තහවුරු වීම
(3) එකට එකතු වීම (4) ඉදිරියට යාම
17. ලේඛකයා තම නිර්මාණය යථාර්ථවාදීව හා **තාත්විකව** ඉදිරිපත් කළ යුතු ය.
(1) අපූර්ව වාග් විලාසයකින් (2) සත්‍ය ස්වභාවයෙන්
(3) සුදුසු අත්දැකිමකින් (4) ආධ්‍යාත්මික හැඟීම් වලින්
18. ප්‍රවෘත්ති වාර්තාකරණයේ මූලිකාංග ලෙස නොසලකනු ලබන කරුණක් වන්නේ,
(1) නිරවද්‍යතාවය (2) සංක්ෂිප්ත භාවය
(3) ප්‍රකාශනයේ පැහැදිලි බව (4) තාර්කාන්විතභාවය
19. කර්ම කාරක අතීත කාල මධ්‍යම පුරුෂ ඒකවචන 'බල' ධාතුවට අයත් නිවැරදි වරණය නොවන්නේ,
(1) බැළිණිහි (2) බලන ලදහි
(3) බලන ලද්දෙහි (4) බැලෙහි
20. අසේව,ඉති වෘත්තය, වැරටිල්ලා, හේළි දහම යන වචනවල නිවැරදි අර්ථය සහිත පදය වන්නේ,
(1) සේවනය, ඉතිරි වූ කොටස්, ඉටි සහිත කොටස්, සත්‍ය කරුණු
(2) වෙහෙසව, කතා පුවත, වියළි ගොම කැබලි, සනාතන දහම
(3) සේවනය, කතා පුවත, වියළි ඉටි, සත්‍ය කරුණු
(4) වෙහෙසව, ඉතිරි වූ කොටස්, ඉටි සහිත කොටස්, සනාතන දහම
21. ''නාට්‍ය වූ කලී කෙනෙකුගේ සිතෙහි පහළවන නිර්මාණාත්මක ප්‍රපංචයකි'' යන ප්‍රකාශය කරන ලදදේ,
(1) ආචාර්ය ජයලත් මනෝරත්න (2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
(3) මහාචාර්ය ඇලඩයිස් නිකොල් (4) ඇල් අයිසෙක් ද සිල්වා

22. නිවැරදි අක්ෂර සහිත වරණය වන්නේ,
(1) සෙබළමුළු, පිළිසඳර, ආශ්චර්ය, මළුව (2) දෘෂ්ටි, ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ, න්‍යෂ්ටි
(3) වෛරාවන, ප්‍රශස්ති, සන්දර්ශන, යෂ්ටි (4) සමස්ත, ප්‍රකාශන, භාෂණ, ඝර්ෂණය

23. නිවැරදි වචන භාවිතය සහිත වචනය නොවන්නේ,
(1) වාක්‍ය, විද්‍යුත්, සූර්යයා, වීර්යය (2) කර්තෘ, ගෘහස්ථ, ප්‍රකෘති, මාතෘකා
(3) චෛත්‍යය, චෛරාවන, වෛරය, මෛත්‍රී (4) දූරකථනය,දූරස්ථ,මූල්‍ය, ව්‍යූහය

24. නිවැරදි ලෙස විසන්ධි කළ පිළිතුර නොවන්නේ,
(1) පිරි + කම්, බිලි +කම්, පස් + දහස්, ගොන් + බාන
(2) මහ+ ඉසිකා, ඊය +ඉන් , මේ + අතින් , දෙ + අවුරුදු
(3) මිණි + අබරණ, පිළි + උතුරු, දිය + ඉති , බුදු + කුරු
(4) මිනිස් + උන් , ගස් + එහි , අත් + ඉන්, සසුන් + අට

25. උපභාෂා ව්‍යවහාරය අනුව දී ඇති ජනවහරට අයත් නොවන වචනයක් ඇතුළත් වරණය වන්නේ,
(1) දකුණු පළාත් ජනවහර- ඔයනවා, සඹුක්කුව, ඇහැකි,පල්ල
(2) උඩරට ජන වහර - සෝමාරියා, සනුහරේ, හෙල්මළු, සිරිප්පානිය
(3) දිගාමඩුලු ජනවහර- ගස් ගෝනා, තුලාන,බුඩා, පනංවෙනවා
(4) නුවර කලාවිය ජනවහර- අත්තම, තාන්තුවාව, මායියා, ආනම

26. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) සූර්යයා - දිවාකර, රවි, හිරු, සහසකර
(2) මව - මාතෘ,ජනනි, මහිලා, අම්මා
(3) විහඟ - සියොත්, දද, කුරුලු, ද්විජ
(4) අනංගයා - කාම දේව, මල්සර, වියොවග, අනඟ

27. උදය,අසන්පත්තිනි දේවතාවී, සිනා කුමරී,අලුත ගෙනා මනමාලි පද්‍ය පන්තිවල රචකයින් පිළිවෙළින් වන්නේ,
(1) මහගමසේකර, සිරිගුණසිංහ, මොනිකා රුවන් පතිරණ, පී.බී.සේනානායක
(2) මහගමසේකර, සිරිගුණසිංහ, පී.බී.සේනානායක, චන්ද්‍රරත්න මානවසිංහ
(3) සිරිගුණසිංහ,මොනිකා රුවන්පතිරණ, චන්ද්‍රරත්න මානවසිංහ, පී.බී.සේනානායක
(4) සිරිගුණසිංහ, මහගමසේකර, පී.බී.සේනානායක, චන්ද්‍රරත්න මානවසිංහ

28. මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) උත්කෘෂ්ට - නිකෘෂ්ට, අධම, නීච, ශ්‍රේෂ්ඨ
(2) සමාන - අතුල්‍ය, විෂම, අසමාන, අසදෘශ
(3) සංවර - නොසන්සුන්, අසංවර, අසංයත, නොදැමුණු
(4) ස්ථිර - අස්ථිර, අස්ථාවර, නොතිර, අනිත්‍ය

29. විභක්ති, විශේෂණ, දකාරාර්ථ, අව්‍ය යන සමාස වලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති පේළිය තෝරන්න.
(1) මිහිපල්, දෙව්දත්තෙර, දුදන, මවුපිය (2) සරාසද, අටසිල්,ඉරහඳ, දුසිල්
(3) නෙතුපුල්, කිරිබත්, තෙල් මල්, ප්‍රබල (4) සුදුමල් , හරක් මස් , දුලද, දවරෑ

30. පහත සඳහන් වැකිවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

- ගැහැණිය වලට **ගොස්** දර කැඩුවාය.
- දරුවා සඳ **ඉල්ලමින්** අඬයි.
- ගුරුතුමිය ශිෂ්‍යාව ලවා පොත **කියවයි**.
- ඔබ **පැමිණියොත්** මම ද එන්නෙමි.

(1) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

31. අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් ඇති පේළිය තෝරන්න.
(1) වනිතාවක්, මාතාවක්, කුමාරතුංගයන්, මා
(2) තා, අප, හිඟන්නන්, ඇවිදින්නෝ
(3) බල්ලෙක්, ගොනකු, දෙවියකු, බඹකු
(4) මෑණියන්, පියාණෝ, තොප, දෙවඟනක

32. **සිරිමත්** බඹ සිරසෙහි පා පිසිනා
සැරියුත් **මහමුගලන්** **පිළිවෙළිනා**
ඉරි ඇඳි පද කුමන ව්‍යාකරණ අංග වලට අයත්ද?

(1) තද්ධිත, සමාස,හා සන්ධි පද වලට ය (2) සන්ධි, තද්ධිත හා සමාස පදවලටය
(3) සමාස, සන්ධි හා තද්ධිත පදවලටය (4) තද්ධිත, සන්ධි හා සමාස පද වලටය

- 32 සිට 36 දක්වා නිවැරදි ව්‍යාකරණානුකූලව යෙදී ඇති වරණය තෝරන්නී

33. 1. දරුවෝ නොමඟ ගොස් ඇත. 2. ඔවුන් තරගය ජයග්‍රහණය කරත්වා
3. තරු පෙළ සැදැ අහසේ බැබළුණේය. 4. සත්තු සඳහා වෙන් වූ උද්‍යානයක් දෙහිවල තිබෙයි.

34. 1. ඔවුහු ක්‍රීඩකයන් වෙති 2. නුඹලා අනාගත පුරවැසියන් ලු
3. අපි ශ්‍රී ලාංකික පුරවැසියෝ 4. කම්කරුවෝ පස් දෙනෙකු පාලම තනා නිම කලහ.

35. 1.මිනිසුන් අවංක නොවන්නේ ඇයි? 2.දක්ෂ ක්‍රීඩිකාවක් වන්නේ කෙසේද?
3.සිසුහු පන්තියට පැමිණ නැත. 4.සියලු මිනිස්සු සත්‍ය ගරුක වීම මැනවි

36. 1.අප සමගිදම් රැකිය යුත්තෙමු. 2.ඔවුහු තුමු ගමට ගියහ.
3.ඕ තොමෝ ගමට ගියේයී. 4.ඒ තෙමේ ගමට ගියාය.

37. 1.අශෝක රජතුමා දැහැමි පාලකයෙකුද? 2.නුඹලා අනාගත නායකයෝ වෙහු.
3.බුදුරජාණන් වහන්සේ දෙව්රමට වැඩම කළේය. 4.සංගමයේ සාමාජිකයෝ බලාපොරොත්තු වන්නේ මොනවාද?

38. වඩාත්ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍ය තෝරන්න.
1. ප්‍රශස්ති ගී වන්දිභට්ටයන් විසින් ගායනාකරනු ලබයි.
2.ඇත් අස් රිය පාබල යනු චතුරංගනි සේනාවයි.
3.බුද්ධි මත් ජනතාවක් දේශයක වාසනාවකි.
4.බලලෝහිත්වය නිසා නිරන්තරයෙන් ම ලෝකයේ විවිධ අරගල ඇති වෙයි.

39. පහත සඳහන් කවියෙහි අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න

සදවා සුදු වැලි පිවිතු රූ
බඳවා රන් දද පියක රූ
සිටුවා දොර දොර රඹතු රූ
තබවා පුන් කුඹු විසිතු රූ

1. පිරිසිදු සුදු වැලිතලාවක කොඩි පේළියට සිටුවා දොරවල් ඉදිරියේ රඹුටන් ගස් සිටුවා ලස්සනට මල් සිටුවා
2. පිරිසිදු සුදු වැලි ඉස සිත් අලවන රන් කොඩි බැඳ ගොයක් පාසා කෙසෙල් ගස් හිටුවා ලස්සන පුන් කළස් තබා
3. පවිත්‍ර සුදු වැලි ද සිත් අලවන රන් කොඩිද ගෙවල් ඉදිරියේ කෙසෙල් ගස් ද සුදු මල් තබා අලංකාර කොට
4. පිරිසිදු සුදු වැලි ඉස,රත්රන් කොඩි බැඳ ගෙයක් පාසා පොල් ගස් සිටුවා මල් සිටුවා අලංකාර කොට

40. ජුරාසික යුගය සත්ත්ව පරිණාමය පමණක් නොව සත්ත්ව විකාශනය අතින්ද ඉතා වැදගත් හූ අවධියක් සේ සැලකේ.

1. ජුරාසික යුගය සත්ත්වයාගේ බිහිවීම හා සත්ත්වයාගේ පැතිරීම අතින්ද වැදගත් වූ හූ විද්‍යාත්මක බවක් ඇති සේ සැළකේ.
2. ජුරාසික යුගය සත්ත්වයාගේ බලපෑම පමණක් නොව සත්ත්වයාගේ පැතිරීම අතින්ද ද වැදගත් වූ හූ විද්‍යාත්මක බවක් ඇති සේ සැළකේ.
3. ජුරාසික යුගය සත්ත්ව පැවත ඒම පමණක් නොව සත්ත්වයා ක්‍රම ක්‍රමයෙන් ඇතිවීම අතින්ද ඉතා වැද ත් හූ අවධියක් සේ සැලකේ.
4. ජුරාසික යුගය සත්ත්ව සංහතියේ රැකගැනීම පමණක් නොව වැදගත්කම පිළිබඳවද හූ විද්‍යාත්මක බවක් ඇති බව සැළකේ